# සංවාද කොටුවලින් කෙරෙන්නේ මොනවාද?

එන්.පී.විජේරත්න

**වින්ඩෝස් ඩයලොග් බොක්සස් හෙවත් සංවාද කොටු අවශ්‍ය තොරතුරු පෙන්වීම සඳහා වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය මගින් උපයෝගී කරගන්නා තවත් එක් උපක්‍රමයකි.**


සංවාද කොටුවක කටයුතු කිරීමේදී ඔබට කිසියම් ගැටළුවක් ඇතිවුවහොත් එහි ඉහල දකුණට වෙන්නට ඇති ප්‍රශ්නාර්ථ ලකුණ දැක්වෙන බොත්තම ක්ලික් කරන්න. එවිට මවුස් පොයින්ටරය ප්‍රශ්නාර්ථ ලකුණ සහිත මවුස් පොයින්ටරයක් බවට පත්වෙයි.

වින්ඩෝස් සංවාද කොටුවක විවිධ මෙහෙයුම් පාලනය කළ හැකි උපක්‍රම කීපයක්ම ඇත. වැඩි වශයෙන් භාවිතයට ගැනෙන්නේ මවුසය යි. ඇතැම් තේරීම් සඳහා යතුරු පුවරුව ද උපයෝගී කරගත හැකි ය. කිසියම් තේරීමක් සඳහා තිබිය යුතු යතුර කුමක්දැයි Copy custom files only ආදි වශයෙන් යටි ඉරක් සහිතව පෙන්වා ඇත. අවශ්‍ය විකල්ප තේරීමෙන් පසුව අවසානයේ OK බොත්තම ක්ලික් කළ යුතු ය. එවිට එම තේරීම් අතිරේක සැකසුම් සඳහා මෙහෙයුම් පද්ධතියට යොමු කරයි.

එසේ මවුසය (හෝ යතුරු පුවරුව) මගින් විවිධ විකල්ප සෙවීම සංකීර්ණ කාර්යයෙකැයි ඔබ සිතන්නේ නම් පැරණි DOSමෙහෙයුම් පද්ධතියේදී ෆ්ලොපි ඩිස්කයක් කොන්දේසි සහිතව ෆෝමැට් කිරීම සඳහා දිය යුතු පහත දැක්වෙන විධානය ගැන අවධානය යොමු කරන්න.

FORMAT A S U F 1440k V PracCom

ඉහත දැක්වෙන්නේ සත්‍ය වශයෙන්ම භාවිතා කළ යුතුව තිබූ ඩෝස් විධානය යි. A ධාවකයේ ඇති ෆ්ලොපි ඩිස්කය පද්ධති ගොනු ද සහිත ය. කොන්දේසි විරහිතය. කිලෝබයිට් 1440 ප්‍රමාණයට PracCom යන වෙළුම් නාමය සහිතව ෆෝමැට් මෙන් එයින් තියම කර ඇත. මෙවැනි විධාන සිය ගණනක් ඔබට මතක තබාගත හැකිද? අපට නම් ඉතාමත්ම අපහසු ය. එහෙත් ඩොස් යුගයේදි එය කළ යුතුව තිබෙන සංවාද කොටු හෙවත් ඩයලොග් බොක්සස් අතිශයින්ම ප්‍රයෝජනවත් වන්නේ එබැවිනි. මෙහි ඇති ඡායාරූපයේ ෆෝමැට් විධානය ම වින්ඩෝස් සංවාද කොටුවක පෙන්වා ඇත. එහිදී ද සංවාද ගොනු එක් කිරීමට හා වොලියුම් ලේබලයක් (වෙළුම් නාමයක්) එක් කිරීමට අවස්ථාව සැලසෙයි.



සංවාද කොටුවේ ඇති සියළුම විකල්ප පහසුවෙන්ම මවුසය මගින් සිලෙක්ට් කළ හැකි ය. ටයිප් කිරීමට සිදුවන්නේ වොලියුම් ලේබලය පමණ ය. සංවාද කොටුවක දකින්නට ලැබෙන විවිධ විකල්ප මෙසේ ය.Drop Down List ( ගලා හැලෙන ලැයිස්තු) සංවාද කොටුවල ඇති පහළට යොමුවූ ඝණ ත්‍රිකෝණය ක්ලික් කළ විට විකල්ප ඇතුළත් මෙනුවක් ගලා හැලෙයි. ෆෝමැට් සංවාද කොටුවේCapacityයටතේ ඇති පාඨ කොටුවේ දකුණු කෙලවරේ ඇත්තේ ඩ්‍රොප් ඩවුන් ඇරෝව යි. එය ක්ලික් කළ විට තේරීම් කිහිපයක් සහිත ඩ්‍රොප්ඩවුන් ලිස්ට් එකක් ( ගලාහැලෙන ලැයිස්තුවක්) මතුවෙයි. සාමාන්‍ය සංවාද කොටුවකදි මෙම ලැයිස්තුව දිග එකක් නම් පසෙකින් මතුවන ඉහළට හා පහළට යොමුවන ස්ක්‍රෝල් (අනුචලන) බොත්තම් එබීම මගින් නොපෙනෙන කොටස් බලා ගත හැකි ය.

Radio Button (රේඩියෝ බොත්තම , ඒක වරණ බොත්තම) සංවාද කොටුවල දකින්නට ලැබෙන රවුම් බොත්තම් විශේෂයකි. ෆෝමැට් සංවාද කොටුවේ FORMAT TYPE යටතේ ඇති QUICK FULL වැනි විකල්ප ඉදිරියේ ඇත්තේ රේඩියෝ බොත්තම් ය. සංවාද කොටුවක කිසියම් කොටසක රේඩියෝ බොත්තම් කොපමණ තිබුනත් ඒවායින් සිලෙක්ට් කළ හැක්කේ එකක් පමණය. සාමාන්‍යයෙන් සුදු රවුමක් වශයෙන් දිස්වෙන රේඩියෝ බොත්තම මවුසය මගින් ක්ලික් කිරීමෙන් සිලෙක්ට් කළ විට මැදට කළු තිතක් එක්වෙයි.

Input Box, Text Box (ආදාන කොටුව, පාඨ කොටුව) ඔබට යමක් ටයිප් කළ හැකි කොටුවේ ඉන්පුට් බොක්ස් නැත්නම් ටෙක්ස්ට් බොක්ස් යන නමින් හැඳින්වෙයි. ෆෝමැට් සංවාද කොටුවේ Label නමින් ඇත්තේ එවැන්නකි.

Check Box (තේරීම් කොටුව) කුඩා හතරැස් කොටු චෙක් බොක්සස් වශයෙන් හැඳින්වෙයි. රේඩියෝ බටන් වලදි මෙන් නොව මේවායේදී කැමති ඕනෑම තේරීම් ප්‍රමාණයක් කළ හැකි ය. සාමාන්‍යයෙන් හිස්ව පවතින තේරීම් කොටු මවුස් ක්ලික් එකක් මගින් සිලෙක්ට් කළ විට මැද හරි ලකුණ සහිතව වෙනස් වෙයි.

සාමාන්‍ය සංවාද කොටුවකදී අවශ්‍ය සැකසුම් කිරීමෙන් පසුව ඒවා ක්‍රියාවට නංවන්නේ OK බොත්තම ක්ලික් කිරීමෙනි. මෙහි ඇති ෆෝමැට් සංවාද කොටුවේ OK වෙනුවට ඇත්තේ STARTය. කිසියම් සංවාද කොටුවකදි ඔබ විසින් සැකසුම් කර බලන ලද්දේ ඒවා සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොව නිකම් අත්හදා බැලීමට පමණක් නම් OKබොත්තම නොඔබා CANCELබොත්තම එබිය යුතු ය. ෆෝමැට් සංවාද කොටුවේදී නම් ඒ වෙනුවට එබිය යුත්තේ CLOSE බොත්තම ය.

සංවාද කොටුවක කටයුතු කිරීමේදී ඔබට කිසියම් ගැටළුවක් ඇතිවුවහොත් එහි ඉහල දකුණට වෙන්නට ඇති ප්‍රශ්නාර්ථ ලකුණ දක්වෙන බොත්තම ක්ලික් කරන්න. එවිට මවුස් පොයින්ටරය ප්‍රශ්නාර්ථ ලකුණ සහිත මවුස් පොයින්ටරයක් බවට පත්වෙයි. එයින් ක්ලික් කිරීමෙන් ඔබ ක්ලික් කරන ස්ථානය පිළිබඳ කුඩා කාටූන් බබල් එකක් ( කොටුවක්) මතුවෙයි. එය කියවා වටහා ගන්න.

සංවාද කොටුවල ප්‍රධාන විධාන බොත්තම හැම විටම සක්‍රීයව පවතී. එය සාමාන්‍යයෙන් OKබොත්තම යි. යතුරු පුවරුවේ ඇතිEnterයතුර එබීම මගින් ද Okබොත්තම එබීමෙන් ලැබෙන ප්‍රතිඵලය – එනම් කරන ලද සැකසුම් ක්‍රියාවට නැංවීම සිදුවෙයි.

යතුරු පුවරුවේ ඉහළ වම් කෙළවරේ ඇති Escබොත්තම එබීම මගින් Cancel බොත්තම එබීමෙන් ලැබෙන ප්‍රතිඵලය – එනම් කරන ලද සැකසුම් අහෝසි කිරීම කළ හැකි ය.

සමහර සංවාද කොටුවල Apply නමින් ද බොත්තමක් ඇත. එය ද Ok බොත්තමේ ආකාරයටම ක්‍රියාත්මක වෙයි. එහෙත් එයින් සංවාද කොටුව නොවසා කරන ලද වෙනස්කම් පරීක්ෂා කළ හැකි ය. ඒවා නිවැරදි නම් Ok බොත්තම ඔබන්න. නැතිනම් අහෝසි කළ හැකි ය.

කිසියම් සංවාද කොටුවක ඉන්පුට් බොක්සස් එකකට වඩා වැඩි ගණනක් ඇත්නම් ඒවා අතර පිළිවෙලින් පහළට යාම සඳහා – එක කොටුවක නිවේශනයක් කිරීමෙන් පසුව Tab බොත්තම ඔබන්න. එසේ කොටු කිහිපයක් පිරවීමට විට එකක අවසානයෙදී කිසිසේත්ම Enter නොඑබිය යුතු ය. එසේ කළහොත් ඔබ සියළුම සැකසුම් කර අවසන් බව සිතන වින්ඩොස් මෙහෙයුම් පද්ධතිය ඒ අනුව කටයුතු කෙරෙයි.

ඩ්‍රොප්ඩවුන් ලිස්ට් වලට සමාන එහෙත් හැම විටකම පෙනෙන්නට ඇති තේරීම් ලැයිස්තු ද ඇතැම් සංවාද කටයුතු වල ඇත. ඒවා හඳුන් වන්නේ ස්ක්‍රෝලිං ලිස්ට් වශයෙනි.